# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## තනතුරු පුරප්පාඩු

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| තනතුර,<br>සේවා ශ්‍රේණිය,<br>පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් | අනෙකුත් අනිවාර්ය අවශ්‍යතා | වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය | සටහන | වයස් සීමාව |
|---|---|---|---|---|---|
| **වරාය ආරක්‍ෂක නියාමක (පිරිමි)**<br><br>**අර්ධ ශිල්පීය 10:3 (SS 3)**<br><br>**50** | දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ:පො:ස (සා.පෙළ) විභාගය සමත් වීම. | i. උස අවම අඩි 05 අඟල් 06 ක් විය යුතුය.<br>ii. පපුව අවම අඟල් 32 (හුස්ම අල්ලා) තිබිය යුතුය. | **10:3 (SS 3)**<br>මූලික වැටුප් පියවර : රු. 35,845/=<br><br>වාර්ෂික වේතනාධිකය : රු. 365/=<br><br>(දළ වැටුප මාසිකව රු. 111,000/= ක් පමණ වේ.) | i. වරාය ආරක්ෂක නියාමක - පිරිමි තනතුරට බඳවාගනු ලබන අය ආරක්ෂක සේවයේ වසර දහය (10) ක කාලයක් ඉකුත් වන තෙක් ආරක්‍ෂක සේවයෙන් බැහැර වෙනත් කිසිඳු තනතුරක් සඳහා සළකා බලනු නොලැබේ.<br>ii. විශේෂ විමර්ශන ඒකකයේ රාජකාරි සඳහා බඳවාගැනීමේදී සන්නද්ධ හමුදා විනයාරක්‍ෂක පොලිස් / අපරාධ පරීක්‍ෂණ රාජකාරිවල නියුක්තව සිට තිබිය යුතුය.<br>iii. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ ලිඛිත හා/හෝ ප්‍රායෝගික හා සම්මුඛ පරීක්‍ෂණයෙන් සමත් විය යුතුය. | අවුරුදු 18-30 අතර විය යුතුය.<br>(රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.) |

| තනතුර,<br>සේවා ගණය,<br>පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් | අනෙකුත් අනිවාර්ය අවශ්‍යතා | වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය | සටහන | වයස් සීමාව |
|---|---|---|---|---|---|
| ගිනිහට<br><br>අර්ධ ශිල්පීය 10:3 (SS 3)<br><br>25 | දෙවරකට නොවැඩි වාර ගණනකදී විද්‍යාව, භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ:පො:ස (සා.පෙළ) විභාගය සමත් වීම.<br><br>සහ<br><br>බර වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රය | i. උස අවම අඩි 05 අඟල් 04 ක් විය යුතුය.<br><br>ii. පපුව අවම අඟල් 34 (හුස්ම අල්ලා) තිබිය යුතුය.<br><br>iii. බර අවම 57 kg ක් විය යුතුය. | **10:3 (SS 3)**<br><br>මූලික වැටුප් පියවර :<br>රු. 35,845/=<br><br>වාර්ෂික වේතනාධිකය :<br>රු. 365/=<br><br>(දළ වැටුප මාසිකව<br>රු. 111,000/= ක් පමණ වේ.) | i. ගිනිහට තනතුරට බඳවා ගනු ලබන අය වසර දහය (10) ක කාලයක් ඉකුත් වන තෙක් එම තනතුරේ සේවයෙන් බැහැර වෙනත් කිසිදු තනතුරක් සඳහා සළකා බලනු නොලැබේ.<br><br>ii. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ ව්‍යුහගත හා/හෝ ලිඛිත හා ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. | අවුරුදු 18-25 අතර විය යුතුය.<br><br>(රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.) |

**වෙනත්**

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.
iv. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණ අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.
v. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.
vi. රජයේ හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු/ සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

සම්පූර්ණ ජීවදත්ත ඇතුලත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතික වල පිටපත් සමඟ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව සකස් කළ අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2026.04.24 දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වග කියනු නොලැබේ. අදාළ **අයදුම්පත් බහලු කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන),**
**මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාශය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13**